# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2139/65 - 2019 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා - 2019.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නින්දවූර් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් සමන්විත වන නින්දවූර් නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8අ වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව නින්දවූර් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් සමන්විත නින්දවූර් නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, එකී පනතේ 8ඊ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 අගෝස්තු මස 29 වැනි දින අනුමත කරන ලද බව, එකී පනතේ 8උ වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**පාඨලී චම්පික රණවක,**
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 අගෝස්තු මස 29 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - G 30922 — 27 (2019/09)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නින්දවූර් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් සමන්විත වන නින්දවූර් නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8අ වගන්තියේ බලතල ප්‍රකාරව නින්දවූර් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් සමන්විත නින්දවූර් නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8ඊ වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 අගෝස්තු මස 29 වැනි දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

**ආචාර්ය ජගත් මුණසිංහ,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 අගෝස්තු මස 29 වැනි දින.

09 - 702

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.